# 4 එළිදරව් සාහිත්‍යය

ලිකිරි ලිකිරි ලිකිරි ටියා
අලෙත් කුරන් ගිඳට ලියා
වඳ ලිට කර ගොබර කුයා
කුකුල කාපි බය දිරියා

මෙම පද පේළිවලින් අදහස් වන පණිවිඩය ඔබට හඳුනා ගත හැකි ද? බැලූ බැල්මට එසේ කළ නොහැකි වුවත්, මෙහි ඇති පද පෙරළියෙන් ඔබට හුරු පුරුදු කවි පෙළක් හඳුනා ගත හැකි වේ.

සංකේත භාවිතයෙන් ලියා ඇති කෘතීන් දෙකක් ශුද්ධ බයිබලයෙහි ද ඇත. මේවා එළිදරව්වාදී ග්‍රන්ථ ලෙස හැඳින්වේ. ඒවා නම්;

1. පුරාණ ගිවිසුමෙහි දානියෙල් පොත
2. නව ගිවිසුමෙහි එළිදරව්ව පොත

අපට හුරුපුරුදු සංකේත කිහිපයක් විමසා බලමු.



4.1 රූපය - පදිකයින් මාරුවන ස්ථානයක්

මෙම සංකේතය හඳුනා ගැනීම හා ඒ අනුව ක්‍රියා කිරීම අනතුරුවලින් ආරක්ෂාවීමටත් ඒවා වළක්වා ගැනීමටත් උපකාරී වේ.



4.2 රූපය - ගිනිගත් නොදැවෙන පඳුර

මෙම රූපය මගින් දෙවියන් වහන්සේගේ වැඩ සිටීම සංකේතවත් කෙරේ.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.



4.3 රූපය - කුරුසිය

දේව ආදරයේ හා ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුකමේ සංකේතය කුරුසිය යි (රෝම 5:8, පිලිප්පි 2:8). කුරුසිය අපගේ ගැලවීමේ සලකුණ යි. කුරුසිය අපට ආභරණයක් නොව පූජනීය වූත් ශුද්ධ වූත් වස්තුවකි. කුරුසියට අමතර ව කිතුනු අපට ම ආවේනික ආගමික සලකුණු ඇති අතර අපි ඒවා ගෞරවයෙන් යුතු ව පරිහරණය කළ යුත්තෙමු.

මෙයින් පැහැදිලි වනුයේ;

★ සන්නිවේදන ක්‍රියාවලියේ දී සංකේත වැදගත් වන බවත්

★ සෑම සංකේතයකට ම විශේෂිත වූ අර්ථයක් ඇති බවත්

★ සංකේතයක අර්ථය නොදන්නා විට එහි පණිවිඩය තේරුම් ගත නොහැකි අතර එයට ප්‍රතිචාර දැක්වීමට ද නොහැකි බවත් ය.

## එළිදරව් සාහිත්‍යය බිහි වූ පරිසරය හා පරමාර්ථ

එළිදරව්ව සඳහා යෙදෙන ග්‍රීක වචනයේ අර්ථය, "සැඟ ව තිබූ යමක් ප්‍රකාශ වීම හෝ අනාවරණය වීම" යි. ඉශ්‍රායෙල් දිවැසිවරුන් ක්‍රමයෙන් අතුරුදහන් වන යුගයක බිහි වූ එළිදරව් සාහිත්‍යය, පීඩන යුගයක සතුරන්ගේ තර්ජනවලට ලක් වූ සැදැහවතුන් දිරි ගැන්වීමට ප්‍රයත්න දරා ඇත. උදහරණ : දානියෙල් පොත




### 1. ද්විත්වවාදය

යහපත් හා අයහපත් බලවේග අතර ගැටුමක් පෙන්නුම් කරයි.

### 2. යුගාන්තවාදය

පරම යහපත හා පරම අයහපත අතර ගැටුමෙන්, අනාගත දිනයක දී පරම යහපත ජයග්‍රහණය කර, සියලු නපුරු බලවේග විනාශ වී, ඇදහිලිවන්තයින් උදෙසා සෞභාග්‍යවත් කාලයක් උදවන බව අඟවයි. එම නිසා වර්තමානයේ කරදර, දුක්පීඩා

ඉවසා දරා ගැනීමට ආරාධනා කරයි. පීඩාකාරී බලය නියත ලෙස පරාජය වන බව යුගාන්තවාදය පෙන්නුම් කරයි. අප ජීවිතයෙහි හමුවන බාධක ගැටලුවලට ඉවසීමෙන් මුහුණදිය හැකි නම්, අවසානයේ ස්වර්ගීය සැපත ලබා ගත හැකි බව අපි මතකයේ තබා ගත යුත්තෙමු.

## 3. සංකේත භාවිතය

සංකේත භාවිතයෙහි පරමාර්ථ දෙකකි:

i සංකේතවල ඇති "ගුප්තභාවය" හෙවත් අභිරහස්මයබව නිසා එම ග්‍රන්ථ විරුද්ධවාදීන් අතට පත් වුව ද බිය විය යුතු නැත. මන්ද ඒවායේ ගැබ් ව ඇති තොරතුරු වටහා ගැනීමට සතුරන්ට නොහැකි වනු ඇත.

ii විරුද්ධවාදීන් අතට මෙවැනි කෘතීන් පත් වුවත් ඒවා ඔවුනට තේරුම් ගත නොහැකි නිසා යහපත් අයගේ ආරක්ෂාව එමගින් සැලසෙයි.

මෙම සංකේත එක් අවස්ථාවක සරල බවක් පෙන්නුම් කරන අතර තවත් අවස්ථාවක සංකීර්ණ බවක් පෙන්නුම් කරයි.

### එළිදරව් සාහිත්‍යයේ එන සංකේත කිහිපයක් හඳුනා ගනිමු



4.4 රූපය - බැටළුවා



4.5 රූපය - මකරා

බැටළුවා - ක්‍රිස්තුන් වහන්සේ
(එළිදරව්ව 5 පරිච්ඡේදය)

මකරා/මෘගයා - යක්ෂයා/පීඩාකාරී බලවේග
(එළිදරව්ව 12 හා 13 පරිච්ඡේද)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

**වර්ණ සංකේත**

සුදු - ජයග්‍රහණය (එළිදරව්ව 6:2)

රතු - යුද්ධය ලේ වැගිරීම් (එළිදරව්ව 6:4)

කළු - සාගතය (එළිදරව්ව 6:5)

සුදුමැලි - මරණය (එළිදරව්ව 6:7)

**සංඛ්‍යා සංකේත**

| | |
|---|---|
| 4 | විශ්වය (දානියෙල් 7:2) |
| 7 | පූර්ණත්වය (එළිදරව්ව 13:1) |
| 10 | පරිපූර්ණත්වය (එළිදරව්ව 17:3) |
| 12 | ඉශ්‍රායෙලය/දේව ජනතාව (එළිදරව්ව 21:1214) |

## 4. ආරූඪ නාමයකින් ඉදිරිපත් කර තිබීම

මෙමගින් කතුවරයාගේ ආරක්ෂාව සැලසීමට මෙන් ම ග්‍රන්ථයෙහි පණිවිඩය පාඨකයාගේ පිළිගැනීමට ලක් කිරීමට උපකාරී වේ. කතුවරයා ලෙස ප්‍රසිද්ධ ගත්කතුවරයකු හෝ ශ්‍රේෂ්ඨයකු හෝ සඳහන් කළ විට පණිවිඩයේ වටිනාකම තහවුරු කිරීමටත් එය පහසුවෙන් ප්‍රචලිත කිරීමටත් උපකාරී වේ. උදාහරණ :-

1. දානියෙල් ග්‍රන්ථය ක්‍රි.පූ. 167-164 පමණ සිරියානු අධිරාජ්‍යයේ iv ඇන්ටිඕකස් යටතේ ජුදා ජාතිකයින් දරුණු පීඩනයකට ලක් ව සිටි සමයක දී ලියවී ඇති නමුත්, ක්‍රි.පූ. 580 පමණ ජීවත් වූ දානියෙල් නමින් ඉදිරිපත් කර ඇත.
2. එළිදරව් පොත ක්‍රි.ව. 80-96 අතර කාලය තුළ ඩොමිෂියන් නම් රෝම අධිරාජ්‍යයා යටතේ වූ දරුණු පීඩන සමයක දී විශ්වාසයේ ස්ථිර ව පැවතීම සඳහා කිතුනුවන් ධෛර්යවත් කරනු පිණිස ලියවී ඇති බව පිළිගැනේ. එකල කිතුනු බැතිමතුන් රෝම අධිරාජ්‍යයා දේවත්වයෙහිලා වැඳුම් පිදුම් නොකිරීම ඔවුන් හිංසා පීඩාවන්ට භාජනය

වීමට මූලික හේතුවක් විය. එළිදරව්ව පොතෙහි කර්තෘත්වය ජොහන් අපෝස්තුලුතුමාට ආරූඪ කර ඇත.

### ක්‍රියාකාරකම

1. එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ **හතර** නම් කරන්න.
2. එම ලක්ෂණ **හතර** කෙටියෙන් විස්තර කරන්න.



*ජීවිතය සඳහා*

★ *පවුලේ සියලු දෙනා ආශීර්වාද කරන ලද කුරුසියක් හෝ බොරලික්කමක් පළඳින්න.*

★ *ආගමික සංකේත මෝස්තර සඳහා යොදා ගන්නා සමාජයක එලෙස නොකරන්නට වග බලා ගන්න.*